Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

දෙවන වාරය - මැයි - 4 වන සතිය

09 ශ්‍රේණිය

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

# සති පාසල 4.

## සාත්වික අභිනය භාවිත කරමු.

නළුවා චරිතයට අදාලව මුහුණෙන් හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි. ආදරය, කරුණාව, කෝපය, ශෝකය, බය ,ජුගුප්සාව, වෛරය වැනි මනෝභාවයන් ප්‍රේක්ෂකයා ඉදිරියේ මැවෙන්නේ සාත්වික අභිනය හරහා ය. මුහුණේ මස්පිඬු, නළල, ඇහිබැම, ඇස, කන, නාසය, නිකට, තොල් වැනි ඉන්ද්‍රියන් තුළින් මනෝභාවයන් ප්‍රකට වේ. සාත්වික අභිනය යනු මනස මූලිකව හටගන්නා භාවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කරවීමයි. මෙම වෙනස්කම් චරිත වල පාලනය පාලනයෙන් තොරව සිදු වේ.

උදා :- දහදිය දැමීම, ඇඟ වෙව්ලීම, රෝමෝද්ගමනය, සිරුර දරදඬු වීම, ගැස්ම ආදිය වේ.

නාට්‍යක සාර්ථකත්වය සඳහා සාත්වික අභිනය බලපාන අතර චරිතයක අභ්‍යන්තරය හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා බෙහෙවින්ම උපකාරී වේ.වෙස්මුහුණු පළඳින පවතින අවස්ථාවකදී සාත්වික අභිනයට බාධා සිදුවේ. නාට්‍යයේ ශෛලිය හා ප්‍රභේදය අනුව ද සාත්වික අභිනයේ වෙනස්කම් සිදුවේ. විවිධ භූමිකා මගින් ප්‍රකට සාත්වික අභිනය විවිධ වේ. චරිතයක ප්‍රබල හෝ දුබල බව ඉස්මතු වීම කෙරෙහි සාත්වික අභිනය ප්‍රධාන වශයෙන්ම බලපා යි. සාත්වික භාව නිරූපණය වඩාත් ප්‍රබල වීමට, මැනවින් ඉදිරිපත් කිරීමට, ඒ සමඟ වාචික, අංගික, ආහාර්යඅභිනය ද එක්විය යුතුය.

## පැවරුම

1. සාත්වික අභිනය යනු කුමක්දැයි හඳුන්වන්න.
2. නළුවකු ගේ මනෝභාවයන් ප්‍රකට කෙරෙන ශාරීරික අංගයන් ලියන්න.
3. පහත සඳහන් හැඟීම් දැනෙන විට ඔබගේ මුහුණට හා ශරීරයට සිදුවන වෙනස්කම් සොයා බලන්න.
   - දුක
   - සතුට
   - කෝපය

- භය
- පිළිකුල
- ලැජ්ජාව

4. ඉහත හැඟීම් සහිත මුහුණු සටහන් පොතේ අඳින්න.